සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## අවසාන වාර පරීක්ෂණය 2022 (2023)

**6 ශ්‍රේණිය** | **ගණිතය** | **පැය දෙකයි**

නම/ විභාග අංකය : ..................................................................................

### I කොටස

- ★ **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.**
- ★ **එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් හිමිවේ.**

---

01. විසිතුන් බිලියන පනස් හතර දහස් හය යන සංඛ්‍යාව සම්මත ආකාරයට ලියන්න.

---

02. $\frac{4}{6}$ ට තුල්‍ය භාග දෙකක් ලියන්න.

---

03. 32546 යන සංඛ්‍යාවේ 2 න් නිරූපිත අගය 4 න් නිරූපිත අගය මෙන් කී ගුණයක් ද ?

---

mathematica.lk

04. 6 වන සමචතුරස්‍ර සංඛ්‍යාව ලියන්න.

---

05. අගය සොයන්න.

| | *l* | *ml* |
|---|---|---|
| | 6 | 375 |
| - | 5 | 692 |

---

06. 16 හි මූල් ගුණාකාර හතර ලියන්න.

---

mathematica.lk

07. සුදුසු අසමානතා ලකුණ යොදා පහත හිස්තැන පුරවන්න.


$2^3$ ............... $3^2$


---


08. යමුනා තම ගණිත ලකුණ ආසන්න දහයට වැටයූ විට ලකුණු 50 ලැබුණි නම් ඇයට ගත හැකි වැඩිම ලකුණ හා අඩුම ලකුණ ලියන්න.

---

09. සවිධි චතුස්තලය සඳහා නොගැළපෙන පතොරම කුමක්ද ? තෝරා යටින් ඉරක් අඳින්න.

1) 

2) 

3) 

mathematica.lk

10. ඉසුරිට අමීෂා පෙනෙන්නේ වයඹ දිශාවෙනි. අමීෂාට ඉසුරිව පෙනෙන්නේ කවර දිශාවෙන් ද ?

11. 3, 9, 10, 4, 16, 21, 15, 25 යන සංඛ්‍යා

i) පොදු වූ ලක්ෂණ අනුව කාණ්ඩ දෙකකට වෙන් කරන්න.

ii) එම පොදු වූ ලක්ෂණ අනුව එක් එක් කාණ්ඩය සඳහා නමක් යෝජනා කරන්න.

12. පහත ප්‍රකාශ හරි නම් "✓" ලකුණ ද, වැරදි නම් "✗" ලකුණ ද යොදන්න.


i) තලයක සිරස් බව දැනගැනීමට ස්ප්‍රීතු ලෙවලය භාවිතා කරයි. ( )

ii) ඝනකයේ සියලු පෘෂ්ඨ තල පෘෂ්ඨ වේ. ( )

13. 18 හි සියලු සාධක ලියන්න.

14. -2 සිට 2 තෙක් ඇති නිඛිල ගණන කීයද ?

15. 43☐ + 261 හි පිළිතුර ඔත්තේ සංඛ්‍යාවක් වීමට හිස්කොටුවට ගැලපෙන ඉලක්කම සඳහා සුදුසු අගයන් දෙකක් ලියන්න.

16. 

mathematica.lk

මෙම කොටු ජාලයේ කුඩා කොටුවක වර්ගඵලය $1\ cm^2$ නම් අඳුරු කර ඇති රූපයේ වර්ගඵලය වර්ග සෙන්ටිමීටර කීයද ?

17. 7, 2, 6, 5 යන ඉලක්කම් හතරම භාවිතා කොට, ලිවිය හැකි ඉලක්කම් හතරේ විශාලම සංඛ්‍යාව හා කුඩාම සංඛ්‍යාව අතර වෙනස කීයද ?

18. $2^2 + ............ = 20$ හි හිස්තැනට සංඛ්‍යාව දර්ශක අංකනයෙන් ලියන්න.

19. පොතක මිල රුපියල් p වේ. එහි මිල රු. 40 කින් වැඩිවූයේ නම්,

i) පොතෙහි නව මිල සොයන්න.

ii) $p = 20$ විට පොතෙහි නව මිල සොයන්න.

20. රු. 785 කට පොතක් මිල දී ගෙන ඒ සඳහා රු. 1 000 ක නෝට්ටුවක් දුන් විට එම පුද්ගලයාට ලැබෙන ඉතිරි මුදල කොපමණ ද?

## ගණිතය - II කොටස

★ **ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට ලකුණු 12 බැගින් හිමිවේ.**
**(ප්‍රශ්න වලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.)**

---

01. (a)

| 607 | 128 | 005 | 034 |
|---|---|---|---|
| දහස් කලාපය | ඒකක කලාපය | බිලියන කලාපය | මිලියන කලාපය |

mathematica.lk

i) ඉහත කාඩ්පත්වල ඇති සංඛ්‍යා සුදුසු පරිදි යොදා ගනිමින් අදාල සංඛ්‍යාව සම්මත ආකාරයෙන් ලියන්න. (ල. 01)

ii) එම සංඛ්‍යාව වචනයෙන් ලියන්න. (ල. 02)

iii) ඔබ ලියූ සංඛ්‍යාවේ (ල. 02)
2 ඉලක්කමේ ස්ථානීය අගය .................................. 2න් නිරූපිත අගය ..........................

iv) 607 ගණක රාමුවකින් නිරූපණය කරන්න. (ල. 01)

(b) දී ඇති සංඛ්‍යා ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| 1, 2, 9, 25, 3, 10, 36 |
|---|

i) ප්‍රථමක සංඛ්‍යා ලියන්න. (ල. 02)

ii) සමචතුරස්‍ර සංඛ්‍යාවක් සහ ත්‍රිකෝණ සංඛ්‍යාවක් යන දෙකටම අයත්වන සංඛ්‍යා ලියන්න. (ල. 01)


iii) හතරවන ත්‍රිකෝණ සංඛ්‍යාව ඇඳ දක්වන්න. (ල. 01)

iv) ත්‍රිකෝණ සංඛ්‍යා 2 ක් එකතුවෙන් සමචතුරස්‍ර සංඛ්‍යාවක් ලබාගැනීමට ගත හැකි සංඛ්‍යා යුගලය කුමක්ද ? (ල. 01)

v) 10 ට අඩු සංයුත සංඛ්‍යාවක් ලියන්න. (ල. 01)

---

02. (a) පූර්ණ සංඛ්‍යා මත ගණිත කර්ම පාඩම සඳහා සැකසූ ක්‍රියාකාරකමක් පහත දැක්වේ.




mathematica.lk

ඉහත ක්‍රියාකාරකම ඇසුරින් A, B, C, D, E, F, G, H සඳහා පිළිතුරු අදාල අක්ෂර ඇතුළත් කොටු තුල ලබාගන්න.
(ල. 06)

| A | B | C | D | E | F |
|---|---|---|---|---|---|
| | | | | | |

mathematica.lk

(b) i) ජපානයෙන් ගෙන්වන ලද ශීතකරණයක වටිනාකම ජපන් යෙන් 100 000 ක් නම්, එහි වටිනාකම ශ්‍රී ලංකා රුපියල්වලින් කීයද ? (ජපන් යෙන් 100 = ශ්‍රී ලංකා රුපියල් 284) (ල. 02)

ii) එය සම්මත ආකාරයෙන් ලියන්න. (ල. 01)

iii) දොඩම් යුෂ පානයක් සෑදීමට දොඩම් යුෂ 300 *ml* කට ජලය 750 *ml* ක් මිශ්‍ර කරනු ලැබේ. දොඩම් යුෂ හා ජලය අතර අනුපාතය ලියා සරලම ආකාරයෙන් දක්වන්න. (ල. 02)

iv) සෑදෙන දොඩම් යුෂ පානයෙන් 500 *ml* පානය කළේ නම් ඉතිරි දොඩම් යුෂ ප්‍රමාණය කොපමණ ද?
(ල. 01)

---

03. (a) හිස්තැන් පුරවන්න.

i) 1 kg = 125 g × .................. (ල. 01)

ii) 3 kg 80 g = ................................ g (ල. 01)

iii)


| kg | g |
|---|---|
| 15 | 87 |
| + 6 | 33 |
| | |

iv)

| kg | g |
|---|---|
| 8 | 542 |
| - 3 | 450 |
| | |

(ල. 04)

(b) දී ඇති රූපයේ පරිමිතිය 47 cm ක් නම් ඉතිරි පාදයේ දිග සොයන්න.




mathematica.lk

(ල. 02)


(c) ධාවන තරගයක දී මුල් මිනිත්තු පහේ දී අරුණ 1350 m ක් ද, මොහොමඩ් 1 km 75 m ක් ද රවී 1 km 400 m ක් ද දිව ගොස් තිබිණි.

i) මොහොමඩ් සහ රවී ගෙවා ඇති දුර මීටර් වලින් ලියන්න. (ල. 02)

මොහොමඩ් ............................................... රවී ...............................................

ii) තිදෙනාගෙන් ඉදිරියෙන් සිටින්නේ කවුද ? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ල. 02)

04. (a) දී ඇති කාඩ්පත ඇසුරින් පිළිතුරු සපයන්න.




i) මෙහි ඇති වෘත්තයේ පාට කළ කොටස භාගයක් ලෙස ලියන්න. (ල. 01)


ii) ඒකක භාග දෙකෙහි එකතුව සොයන්න. (ල. 03)

iii) දශම සංඛ්‍යා "<" සංකේතය යොදා සම්බන්ධ කරන්න. (ල. 01)

iv) 0.43 භාගයක් ලෙස ලියන්න. (ල. 01)

v) අගය සොයන්න. $\frac{7}{10} - \frac{2}{5}$ (ල. 02)

(b)



5 cm

i) ඉහත පතරම භාවිතයෙන් සෑදිය හැකි ඝන වස්තුවේ නම ලියන්න. (ල. 01)

ii) ඔබ සඳහන් කළ ඝන වස්තුවට උදාහරණයක් ලියන්න. (ල. 01)

iii) එම ඝන වස්තුවේ එක් මුහුණතක පරිමිතිය සොයන්න. (ල. 01)

iv) ඉහත (i) හි ඝනවස්තුවට සමාන දාර, ශීර්ෂ හා මුහුණත් සංඛ්‍යා ඇති වෙනත් ඔබ උගත් ඝන වස්තුවක් නම් කරන්න. (ල. 01)

---

05. (a) 2022 මැයි 3 වන දින පාසලේ පැවැත්වූ බාලදක්ෂ කඳවුරේ පළමු දින න්‍යාය පත්‍රය පහත දැක්වේ.

| | |
|---|---|
| ප.ව. 5.30 | සාමාජිකයින් ලියාපදිංචි කිරීම. |
| ප.ව. 6.00 | ධජ එසවීම. |
| ප.ව. 6.05 | බාලදක්ෂ නායකගේ පිළිගැනීම. |
| ප.ව. 6.30 | රාත්‍රී අහස පිළිබඳ දේශනය. |
| රාත්‍රී 8.00 | රාත්‍රී ආහාරය. |
| රාත්‍රී 8.30 | බාලදක්ෂ ගීතිකා ගායනය. |
| රාත්‍රී 9.30 | නින්දට යාම. |

mathematica.lk


i) ඉහත දිනය සම්මත ආකාරයෙන් ලියන්න. (ල. 01)

ii) ධජ එසවීම සඳහා වෙන්කර ඇති කාලය තත්පරවලින් ලියන්න. (ල. 02)

iii) කඳවුරේ පළමු දින වැඩසටහන සඳහා ගත වූ මුළු කාලය සොයන්න. (ල. 02)

iv) බාලදක්ෂ ගීතිකා ගායනය ඇරඹුණු වේලාව සම්මත ආකාරයෙන් ලියන්න. (ල. 01)

(b) එක්තරා දිනක ලෝකයේ නගර කිහිපයක උෂ්ණත්වය සෙල්සියස් අංශකවලින් පහත සංඛ්‍යා රේඛාවේ ලකුණු කර ඇත.




i) අඩුම උෂ්ණත්වය තිබූ නගරය කුමක්ද ? (ල. 01)

ii) B නගරයේ උෂ්ණත්වය හා C නගරයේ උෂ්ණත්වය අතර වෙනස ඒකක කීයද ? (ල. 02)

iii) F නගරයේ උෂ්ණත්වය සෙල්සියස් අංශක (-10) ක් නම් එය ඉහත සංඛ්‍යා රේඛාව මත ලකුණු කරන්න. (ල. 01)

iv) G නම් නගරයක උෂ්ණත්වය නිඛිලමය අගයක් වන අතර එය D හා B නගර වල උෂ්ණත්ව අතර පිහිටයි නම්, G හි උෂ්ණත්වයට ගත හැකි නිඛිලමය අගයන් සියල්ලම ලියන්න. (ල. 02)

---

06. එක්තරා වෙළඳසැලක දින 5 ක් තුළ විකිණුණු බිත්තර සංඛ්‍යාව පහත වගුවේ දැක්වේ.

| දවස | බිත්තර ගණන |
|---|---|
| සඳුදා | 24 |
| අඟහරුවාදා | 18 |
| බදාදා | 16 |
| බ්‍රහස්පතින්දා | 31 |
| සිකුරාදා | 09 |

mathematica.lk

i) බිත්තර 4 ක් O සලකුණු එකකින් නිරූපණය කෙරේ යැයි සලකා ඉහත තොරතුරු චිත්‍ර ප්‍රස්තාරයකින් දක්වන්න. (ල. 05)

ii) බදාදා දින අලෙවි වූ බිත්තර සංඛ්‍යාව ප්‍රගණන ලකුණින් දක්වන්න. (ල. 01)


iii) අඩුම බිත්තර අලෙවියක් වී ඇති දවස කවදා ද ? (ල. 01)

iv) දින පහ තුල අලෙවි වූ මුළු බිත්තර සංඛ්‍යාව කොපමණ ද ? (ල. 03)

v) බිත්තරයක විකුණුම් මිල රු. 50 ක් නම් දින පහ තුල බිත්තර විකුණා ලැබූ ආදායම කොපමණ ද ? (ල. 02)

---

07. (a)




mathematica.lk

i) දී ඇති රූපයේ හැඩතල නම් කරන්න. (ල. 02)

R - ............................................................ Q - ............................................................

ii) දී ඇති කෝණ අයත් කෝණ වර්ගය නම් කරන්න. (ල. 02)

a - ............................................................ b - ............................................................

iii) R තල රූපයේ ලක්ෂණයක් ලියන්න. (ල. 01)

iv) R සහ Q එක් කළ විට සෑදෙන තල රූපයේ නම ලියන්න. (ල. 01)

v) P හා S තල රූපවල එකිනෙකට වෙනස් ලක්ෂණයක් ලියන්න. (ල. 01)

vi) ඉහත කොටු දැලෙහි එක් කොටුවක වර්ගඵලය $1\ cm^2$ නම් U තල රූපයේ වර්ගඵලය කොපමණද ? (ල. 01)

(b) i) එකතු කරන්න. $0.8+5.74$ (ල. 01)

ii) 5 සහ 10 යන සංඛ්‍යා දෙකෙන්ම ඉතිරි නැතිව බෙදෙන, ස්ථාන 2 ක් සහිත විශාලම සංඛ්‍යාව ලියන්න. (ල. 01)

iii) 9, 75 හි සාධකයක් ද ? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ල. 02)

PARCEL NO

# LOL.lk BookStore

# විභාග ඉලක්ක
## පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION | pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

**සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට**

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**